www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මයිකල් ජැක්සන්ගේ ඛේදවාචකය

## Michael Jackson’s tragedy

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2003 දෙසැම්බර් 01**

මයිකල් ජැක්සන් අත් අඩංගුවට ගැනීම හා ඔහුට එරෙහි ළමා අපචාර පිලිබඳ අධි චෝදනාව සමග ජනප්‍රියයන් හා ලිංගික කටයුතු අලලාගත් මෑතම සෝලියට ඇමරිකානු මහජනතාව ගොදුරු කෙරී ඇත. තම හුරුපුරුදු තලු මැරීමේ උමතුවටද, වක්‍රෝක්තිසහගත හා කාමුක විස්තරය සඳහා තරග වැදීමටද විවිධාකාර ජනමාධ්‍යයන්ට මෑතම කටකතාව තවත් අවස්ථාවක් පාදා දී තිබේ.

ජැක්සන් නඩුව ආශ්‍රිත පුවත්පත් හා රූපවාහිනී ආවරනය මාස ගනනාවක් පුරා ඇදී යනු නියත ය. මෙම ආවරනය තුල තම තමාගේ සුවිශේෂිත “කෝනය” මත පදනම්ව මාධ්‍ය පන්ඩිතයන් සහ කතා මෙහෙයවන්නන් සිද්ධිය පිලිබඳව දැඩි මත පලකිරීම්, උදම් ඇනීම් හෝ මුග්ධ ලෙස සිනාසීම් කරනු ඇති නමුත්, එකදු බැරෑරුම් අන්තර්ඥානයක් සම්පාදනය නොකරනු ඇත.

ජනමාධ්‍යය මෙම කනගාටුදායක සිද්ධිය තුල කිහිප ආකාරයකට ක්‍රියාත්මක වෙයි: එනම් සුවිශේෂිතවම ඉරාකය තුල සිදු කෙරෙමින් පවතින හිංසනය හා ඝාතනයද ඇතුලු සැබෑ දැවෙන ප්‍රශ්නයන්ගෙන් මහජන අවධානය අපසරනය කිරීමට, හැකි සෑම ආකාරයකින් ම මහජන විඥානය දූෂනය කිරීම හා නිර්වින්දනය කිරීමට සහ අලෙවිය වැඩිකර ගැනීම හා ප්‍රචාරනය ගොඩනංවා ගැනීම පිලිබඳ අපේක්ෂාවෙන් “සල්ලි ගැරිය හැකි” ඕනෑ ම දෙයක් පසුපස හඹා යෑම යනාදී වසයෙනි.

නඩුවට අදාල කරුනු තවමත් ඉදිරිපත් කෙරී නැති අතර මයිකල් ජැක්සන්ට සිය නිර්දෝෂීභාවය පිලිබඳව පූර්වාපේක්ෂා කිරීමට ඉඩක් තිබේ. වාර්තා වන ආකාරයට ඔහුගේ පැමිනිලිකරු පිලිකා රෝගයෙන් සුවය ලබා සිටිනා වයස 12-13 පමන ළමයෙකි. ඔහු මයිකල් ජැක්සන්ට අයත් උතුරු සාන්ත බාබරාවෙහි පිහිටි නෙවර්ලන්ඩ් වතුයායෙහි සිටි ඔහුගේ අමුත්තෙකි. ගායකයා බරපතල ලෙස රෝගාතුර වූවන්ට ඔහුගේ වතුයායෙහි දී සත්කාරක කටයුතු කරයි.

ජැක්සන්ගෙන් විශාල මුදල් කුට්ටියක් කඩා ගැනීමට පිරිමි දරුවාගේ මව මෙම නීතිමය පියවර දියත් කොට ඇති බව ගායකයා වෙනුවෙන් පෙනී සිටින්නෝ චෝදනා කරති. නොවැම්බර් 25 වන දා ජැක්සන්ගේ නීතිඥ මාක් ජෙරාගස් කෝපාන්විතව මෙසේ පැවසී ය. “මේ වෙනකොට සිද්ධවෙලා තියෙන විදිහට මේ චෝදනාවලත් වරද පැටවීම්වලත් සැබෑ අරමුන මුදල් සහ මුදල් අපේක්ෂාව මිසක් වෙන දෙයක් නෙවෙයි කියලා නොහිතන කවුරු හරි ඉන්නවානම් ඔවුන් ජීවත් වෙන්නේ ඔවුන්ගේ ම නෙවර්ලන්ඩ් එකකයි.”

අපචාර චෝදනා පැටවීම පිලිබඳ ඉතිහාසයක් පිරිමි දරුවාගේ මවට පවතින බවට පුවත්පත්වල වාර්තා පල වී තිබේ. එසේම කාන්තාව හා ඇගේ දරුවා විසින් පසුගිය පෙබරවාරියේදී සකසන ලද ජැක්සන්ව වර්නනා කරන හා කිසිදු අයථා චර්යාවක් සිදුව තිබෙන බව පිලිබඳ මතය ප්‍රතික්ෂේප කරන හඬපටයක් ද එලිමහනට අවුත් තිබේ. තම ජීවිතවලට ජැක්සන් ලඟා කොට දීම මගින් දෙවියන් වහන්සේ තම පවුලට ආශිර්වාද කොට ඇතැයි ද ඇයගේ පුතාට ඔහු “පියෙක් වැනි” යයි ද කාන්තාව හඬපටයෙහි පැහැදිලිව ප්‍රකාශ කරයි. එම කරුන මත ම අත්සන් තබන ලද දිවුරුම් පෙත්සමක් ද පවතින බව වාර්තා වේ. දරුවාගේ පියා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයෙක් ජැක්සන්ට එරෙහි චෝදනා පිලිබඳව වාද කොට ඇත.

ජැක්සන්ට එරෙහිව සාන්තා බාබරා බලධාරීන් විසින් ගෙන යනු ලබන ව්‍යාපාරය ප්‍රතිගාමී දේශපාලන සහ සමාජ ඇඟවීම් සහිත ය. කෝරලයෙහි දිස්ත්‍රික් නීතිඥ ස්නෙඩන් වනාහි ඇටුවන් බැහැපු දැනුවත් තත්වාරක්ෂක රිපබ්ලිකානුවෙකි. ගායකයා සිවිල් නඩුවක් පවරා තිබූ පවුලක් සමග උසාවියෙන් පිටතදී ප්‍රශ්නය සමථයකට පත් කොට ගත් අවස්ථාවක 1993දී ඔහු ජැක්සන්ට එරෙහිව මේ හා සමානම චෝදනා යටතේ නඩු පැවරීමට බලාපොරොත්තුවෙන් සිටියේ ය.

ගායකයා පසු කලෙක ස්නෙඩන්ට එරෙහිව යන්තමින් සඟවා කෙරෙන ප්‍රහාරයක් ලෙස ගීතයක් ලියා පටිගත කොට පලි ගත්තේ ය. දිස්ත්‍රික් ඇටර්නිවරයාට, ඔහු විසින් චෝදනාවන් නිවේදනය කල, පසු ගිය බදාදා පැවැති පුවත්පත් සාකච්ඡාව අතර තුර තම ප්‍රීතිය සඟවා ගැනීමට හැකි වූයේ යන්තමිනි. ජැක්සන්ගේ වතු යායට කෝරලයෙහි (county) ෂෙරීෆ් දෙපාර්තමේන්තුවේ 70 දෙනෙක් පීඩාකාරි ලෙස බලයෙන් කඩා වැදීම මගින් සාන්ත බාබරා නිලධාරීන් ඒ වන විටත් ඔවුන්ගේ ප්‍රවිශ්ටය පෙන්නුම් කර තිබුනි.

*ඒබීසී නිවුස්* සමග කල සම්මුඛ සාකච්ඡාවකදී, මයිකල්ගේ වැඩිමහල් සහෝදරයන්ගෙන් කෙනෙකු වන ජර්මේන් ජැක්සන්, ස්නෙඩන්ගේ “පුද්ගලික බද්ධ වෛරය” හෙලා දුටුවේ ය. “ඔවුන් මහජනයා ගැන කිසිම සැලකිල්ලක් නැති දක්ෂිනාංශික වර්ගවාදීන් රොත්තක්” යනුවෙන්ද ඔහු පැවසී ය. කලින් සීඑන්එන් නිවේදිකාවක් සමග දුරකථන සංවාදයකදී ජර්මේන් ජැක්සන් නඩුව “අද දවසේ නඩු නැති අච්චු කිරීමක්”

(a modern-day lynching) යැයි හැඳින්වී ය. අතීතය පිලිබඳව මයිකල්ට පැවසීමට අම්හිරි සිද්ධීන්ට සම්බන්ධිත ඔහුගේ පියාද ඇතුලුව මුලු ජැක්සන් පවුලම ගායකයාගේ ආරක්ෂාවට පැමින සිටී.

තමන් සංස්කෘතික හා සදාචාර යුද්ධයක කුරුස යුද්ධකරුවෙක් ලෙස ස්නෙඩන් තමන්ව දකින බව නිසැක ය. ජැක්සන් පිලිබඳව නරකට ම සිතන්නා වූ, දශකයකට පෙර ඔහු දන්ඩනයෙන් ගැලවීම පිලිබඳව තදින් ම විරුද්ධවූ හා ඔහුව කුරුසියෙහි ඇන ගසනු දැකීමට කැමැති සමාජ ස්ථරයක් මේ රටේ සිටී. දක්ෂිනාංශික බලවේග විසින් දිරිමත් කෙරුනු සිරකොටගෙන සිටි කෝපයක් හා කල කිරීමක් ඔහු දෙසට හැරවී ඇත. ඉලක්කයන් අතර සමානකම් ඇත්තේ ඉතා මද වසයෙන් වීමත්, චෝදනාවන් මුලුමනින් ම වෙනස් වීමත් තිබියදී ම 1895දී ඔස්කාර් වයිල්ඩ් දඩමීමා කොට ගැනීම පිලිබඳ ඉඟියක් වත්මන් සිදුවීමෙහි තිබේ.

ජැක්සන් වනාහි බිඳවැටුනු ඇතැම් විට බරපතල ලෙස අවුලට පත් වු පුද්ගලයෙක් බව අවිවාදිතව ම පෙනේ. ඔහුට චෝදනා කෙරී ඇති අපරාධයන්ට ඔහු වැරදිකරුවාද නැද්ද යන්න වෙනත් කාරනාවකි. ප්‍රශ්නයට අදාල කාරනාවන් කුමක් වුවද කෙනෙකු නිරායාසයෙන් ම පෙලැඹෙනුයේ, ජැක්සන්ට එරෙහිව නඩු පැවරීමට හැකි නොවී නම්, නීතිය ක්‍රියාත්මක කරන නිලධරයන් සහ මාධ්‍යය ඔහුට එරෙහි චෝදනා නිර්මානය කොට එවැන්නක් කලයුතුව තිබූ බව පැවසීමට ය.

චර්යාවේ, විශේෂයෙන්ම ලිංගික චර්යාවේ විකාර සහගත එක්සත් ජනපදයේ නෛතික-පොලිස් සංස්ථාපිතයේ සැලකියයුතු කොටසක් විසින් දැක ගෙන ඇත්තේ අපරාධකාරී හැසිරීමක ආසන්නතම සාධකය ලෙස ය. සමාජයෙන් ඔහු වෙන්ව සිටීම සාධාරනීකරනය කරනු වස් මෙබඳු අපරාධයන්ට ජැක්සන් වරදකරුවා බව ඔප්පු කෙරුනේ වුවද මානුෂ්‍යත්වයෙන් යුත් සමාජයක් ඔහුව දකිනු ඇත්තේ, අවමානයෙන් හා වෛරයෙන් යුතුව නොව ශෝකයෙන් මෙන්ම අනුකම්පාවෙන්ද ද යුක්තව ය.

මයිකල් ජැක්සන්ට තමන් කවුද යන්න පිලිබඳව තමන්ටමත් ඇත්තේ පැහැදිලිව ම ඉතා කුඩා අදහසක් වන කල, අනෙක් මිනිසුන්ට ඔහු ගැන ඇතිකරගත හැක්කේ කුමක්ද? ඔහුගේ ජීවිත කතාව වනාහි ජනප්‍රවාදයෙන් පිරුනකි. 1958 දී වානේ කම්හලක දොඹකර ක්‍රියාකරවන්නෙකුගේ පුතකුව සහ දරුවන් නව දෙනෙකුගෙන් කෙනෙකුව චිකාගෝවේ කම්කරු පන්ති උපනාගරික ප්‍රදේශයක් වන ඉන්ඩියානාහි ගැරි හි උපත ලත් ජැක්සන්, වයස අවුරුදු පහේ දී තම වෘත්තීය ජීවිතය ඇරඹූයේ ජැක්සන් ෆයිව් කන්ඩායමේ ප්‍රධාන ගායකයා ලෙසය.

ජයග්‍රහන මාලාවකට මඟ පාදමින් කන්ඩායම 1968දී මෝටවුන් රෙකෝඩ්ස් සමාගම විසින් ගිවිසුමකට බඳවා ගැනින. ඒකල ගායකයකු ලෙස 1970 ගනන් අගභාගයේ සිට දශකයකට ආසන්න කාලයක් ජැක්සන් ජාත්‍යන්තර ජනප්‍රිය සංගීතයේ ප්‍රමුඛතමයා විය. 1982දී නිකුත් වූ, නිෂ්පාදක ක්වින්සි ජෝන්ස් සමග ඔහු කල දෙවන ඇල්බමය වූ “ත්‍රිලර්” අත්‍යසාමාන්‍ය සාර්ථකත්වයකට පත් වූයේ ය. ගීත හතක් ගීත දර්ශකයන් හි ඉහලින්ම වාර්තාගත වූ අතර ලොව වටා පිටපත් මිලියන 50කටත් වඩා අලෙවි විය. 1984දී ජැක්සන් සියලු වාර්තා බිඳ හෙලමින් ග්‍රැමී සම්මාන අටක් දිනා ගත්තේ ය.

ජැක්සන් තම පුද්ගලික දුෂ්කරතාවයන් පිලිබඳව විවෘතව කථා කොට තිබේ. ඔහුගේ පියා දරුවන් මත වෙහෙසකර ලෙස බලය පැතිරවූ හා ඔවුන්ව පාලනය කල අයෙකු වූ බව ඔහු ප්‍රකාශ කරයි. මෙය ඔහුගේ සහෝදරයින් විසින් ද තහවුරු කෙරී ඇත. නිරතුරුවම ඔහුට ගුටි කෑමට සිදු විය. ජෝශප් ජැක්සන් තමන්ට සමච්චල් කිරීම හා අවමන් කිරීම ද කරන බව ඔහු පුත් මයිකල් පවසයි.

“මං එයාගේ හොඳම දරුවාද නැත්නම් වෙන කවුරුහරිද කියන්න මම දන්නේ නෑ. නමුත් ඔහු කිසිම බුරුලක් නැති, ඉතා තද ඉතා රලු මිනිහෙක්. බැලුවත් බය වෙනවා ... ඔහු මාව බලන්න ආවම මට අසනීප වෙලා වමනෙ යන්න පටන්ගත්ත කාලවලුත් තියෙනවා, යි ඔහු ඔප්රා වින්ෆ්‍රිට 1993දී පැවසී ය. තම ජීවිතයේ වැඩි කොටසකටම උරුම වූයේ තනිකම හා දුක යැයි හැඟැවෙන අදහසක් ඔහු එම සම්මුඛ සාකච්ඡාවේදී දුන්නේ ය.

ලපටි වයසක සිටම ජැක්සන් ප්‍රකට චරිතයක් ව සිට ඇත. ඔහු අද සිටින තැනට ඒමට උපකාර කලේ විනෝද කර්මාන්ත ව්‍යාපාරයයි. දෝෂාරෝපනයද හිමි එයටම ය. යමෙකුගේ ජීවිතය සම්බන්ධයෙන් බොරු මවා පෑම් සහ අයථාර්ථවත් දෑ නිරතුරුවම ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීමෙන්, ඔහුගේ හෝ ඇයගේ පුද්ගලික දුක්ඛ දෝමනස්සයන් සඟවා තැබීමත් යන දෙකරුන විසින් එහි වන්දිය ගනු ලැබේ. ජැක්සන් සම්බන්ධිත මෙම සිද්ධියේදී පැහැදිලිවම එහි වන්දිය ගෙන ඇත්තේ සුවිශේෂිත රූපාකාරයකිනි.

වසර බොහෝ ගනනක්ම තමා “වේදිකාව මත ඉතා සුවපහසුවෙන්” සිටි බවත් මෙය ඔහුගේ සැබෑ “නිවහන” වූ බවත් ගායකයා පිලිගෙන තිබේ. යථාර්ථය සඳහා ම වේදිකාව මතට ගෙන ඒම පිලිබඳව කිසිවකුත් ඔහුට චෝදනා කල යුතු නැත.

මෙතෙක් මිහිමත නිර්මිත ශ්‍රේෂ්ඨතම “වෙස්මාරුව” වන, කලු ජාතික ප්‍රසාංගිකයෙක් සම්බන්ධයෙන් ගත් කල්හි තම අනන්‍යතාවය වලලා දැමීම අතිරේක හා හානිකර අර්ථ භාරයත් දැරිය යුතුව තිබුනි. ජැක්සන්ගේ කායික විපරිවර්තනය හේතුවෙන් යම් කිසිවෙකු අතිශයින්ම කම්පිත හෝ සැහැසි විය යුත්තේ මන්ද? ඔහු හුදෙක් සංස්කෘතියේම තර්කනයන්, එනම් සාවද්‍ය සහ අයාථර්තය කෙරෙහි දැඩි ඇබ්බැහිවීම සහ ඒවායෙහි තාර්කික නොහොත් විකාර සහගත නිගමනයන්ට ඇබ්බැහි වීම අනුගියා පමනෙකි.

ඔහුගේ අපරිනත භාවය ද එම කරුනුම හා බැඳී ඇති බව පෙනේ. එනම් ඔහුගේ ජීවිතය සෑම උමතු ආශාවක් ම සපුරාලීමට කැපවුනු යෝධ පරිවාර සේනාවකින් නිශ්චිත මොහොතකදී වටවුනු සංදර්ශන

ව්‍යාපාර කෝෂයක් තුල ගෙවුනු, එකකි. "පීටර් පෑන් සංකීර්නය", බැලු බැල්මටම ව්‍යාජ විවාහ, ඔහුගේ තෙවන දරුවා සඳහා ආදේශක මව ආදී සියල්ලම ඇඟිල්ල දිගු කොට පෙන්වනුයේ එකිනෙක හා ගැටෙන අවශ්‍යතාවයන් රොත්තක් තුල දඟලන්නාවූ මිනිසෙකි.

"ඇමරිකා", එනම් නිල මහජන ඇමරිකානු මතය ඔහුගෙන් ඉල්ලා සිටින; වඩා සුදු, ලිංගිකව ආක්‍රමනශීලී නොවන, විරුද්ධ ලිංගික පහස සොයන පියෙකු වීම උදෙසා ඔහුගේ සියලුම මංමුලා සහගත (සහ ශෝකාකුල වූ ද) වෑයම් සියල්ල, තම සැබෑ ස්වීයත්වය පිලිබඳව සෑම සංකල්පයකින් ම ඔහු තව තවත් ඈත් කර දැමී ය. මෙම ව්‍යාජය හා යථා විරහිත භාවය අභිමුවෙහිදී ජැක්සන් එක් සත්‍යයක් සැබැවින්ම ඒත්තු ගෙන සිටින බව පෙනේ. එනම් ඔහුට තම ජීවිතය දරුවකු සේ විඳිය හැකි නම් එය වඩාත් සන්තුෂ්ටිදායක වනු ඇති බවයි.

ඇමරිකාවේ නිතර සිදු වන අයුරු සාර්ථකත්වය තරම් හානියක් තවත් නැත. සාර්ථකත්වය ඉහලයත් ම හානිය ද ඉහල යයි. දියුනුවීම තරම් හානිකර වෙනත් දෙයක් නොමැති බවත්, දියුනුව විශාල වත්ම හානියද විශාල වන බවත්, පැහැදිලිවන සිද්ධීන් ඇමරිකාව තුල නිරතුරුව සිදුවේ. දුෂ්ක්‍රියාත්මක කම්කරු පන්තික පවුලකින් පැමිනි මුලුමනින්ම අස්වාභාවික ලෙස දක්ෂ පිරිමි දරුවකු ලෙස ජැක්සන්ව ඇමරිකානු විනෝද කර්මාන්තයේ ඇඹරුම්ගල තුලට ගසාගෙන යැවුනු අතර එමගින් අතිශයින්ම ඉෂ්ටාර්ථවත් මොහොතේදීම, මානසිකව ව්‍යසනයට ගොදුරුවීමට ඔහුගේ ඇති හැකියාවද ලබා දී ඇත.

ජැක්සන්ගේ ඉමහත්ම පුද්ගලික අභිවෘද්ධිය, එක්සත් ජනපදයේ රීගන් අවුරුදු හා සමපාත විය. මෙය, ඇමරිකාවේ බොහෝ දෙනා තමන්ගේ හෝ අන් අයගේ, 1970 ගනන්වල රැඩිකල්වාදය පසුපසට දමා ධනවත් වීමේ ව්‍යාපාරය මත අවධානය සංකේන්ද්‍රනය කල අවධියකි. ආත්මාර්ථකාමීත්වය, සුඛ පරම වාදය, පුද්ගලවාදය, හා මාත්සර්යය කිරුලු පැලැන්දවින. ජැක්සන් අසිරිමත් ලෙස ප්‍රතිභාසම්පන්න ගායකයෙක් නර්තකයෙක් හා පද රචකයෙක් වූ නමුදු, සංගීතය මගින් යමක් කීමේ යමෙකුගේ හැකියාව වනාහි උප්පත්තියෙන් ලැබෙන්නක් නොවන අතර අඛන්ඩ පුහුනුවෙහි සහ දෙමාපිය පීඩනයෙහි ද නිෂ්පාදිතයක් නොවන්නේ ය.

විශේෂයෙන් මෝටවුන් මගින් ජැක්සන් ෆයිව් කන්ඩායම සංගීත ක්ෂේත්‍රයට පැමිනියේ පෘථුල ව්‍යාප්ත විරෝධතාවයක යුගයකදී ය. "කලු ධනවාදය" උද්යෝගිමත්ව අදහන්නකු වූ බෙරී ගෝර්ඩිට අයත් තැටිගත කිරීමේ සමාගම රැඩිකල් ධාරාවන් සමග සම්බන්ධතාවයෙන් වැලකෙනු ලැබ නොතිබුනි.

1971දී ගෝර්ඩි සහ ගායක මාර්වින් ගයේ ගැටුනේ, වියට්නාම් යුද විරෝධී ගීතයක් වූ "වට්ස් ගොයිං ඔන්" ("What's Going On") නම් ගීතය තැටිගත කිරීමට ගයේට පැවැති අභිරුචිය මත ය. ගයේගේ ඥාති සහෝදරයා වියට්නාමයේදී මිය ගොස් තිබූ අතර ඔහුගේ සහෝදරයා එහි තෙවරක් සේවය සඳහා ගොස් තිබුනි. ගයේ එකල ප්‍රශ්න නගා තිබුනේ, "මගේ වටේ පුපුරා හැලෙන ලෝකයකුත් එක්ක මං කොහොමද පෙම් ගී ගය ගයා ඉන්නේ?" යනුවෙනි. ස්ටීවි වොන්ඩර් බඳු අනෙකුත් කලු ප්‍රසාංගික කරුවෝ, 1970 ගනන් මුලදී රිචඩ් නික්සන් පිලිබඳව ඉතාමත් විවේචනාත්මක ගීත තැටිගත කලහ. කර්ටිස් මේෆීල්ඩ් යුද්ධයේ සහ වර්ගවාදයේ විවෘත එදිරිවාදියෙක් විය.

මේ සියල්ලට සංගීත කර්මාන්තයේ විෂ නාශකයන්ගෙන් එකක් ලෙස "බබල්ගම් ආත්මය" ලෙස ප්‍රකට වුනු දෙය සමගින් ජැක්සන්ලා සේවය කලේ, ඔවුන්ගේ වරදකින් නොවේ. තම ලමා සංගීතමය ප්‍රතිරූපය සමගින් ජැක්සන් 1970 ගනන් අගදී කැඩුනි. එහෙත් ඔහුගේ සාර්ථකත්වය අධිතක්සේරු කිරීමට අවශ්‍ය නැත. ඔහු අත්‍යසාමාන්‍ය දක්ෂතාවයන් විදහා පෙන්වූ නමුදු ඔහුගේ ගීතවල අන්තර්ගතය සැලකියයුතු අන්තර්ඥානයක් කරා එසැවී නොගත් අතර නිශ්චිතවම විරෝධාත්මක කුටයන්ට නොනැගුනි. ජැක්සන් පිලිබඳ මාධ්‍ය සාකච්ඡාව තුල ඔහුගේ සැබෑ දායාදයන් අගය කිරීමත්, මාධ්‍යවේදීන් හා කර්මාන්තය තුල සිටින්නවුන් ඔහුගේ අලෙවි වාර්තා සහ පුද්ගලික ධන සමුච්චය ඉදිරියේ දැවැන්ත ලෙස විශ්මයට පත්වීමත් වෙන් කොට හඳුනාගැනීමට කෙනෙකුට සිදු වේ.

1970 ගනන් අග සහ 1980 ගනන්, ඔපමට්ටම් කල නමුත් දියාරු විනෝද කර්මාන්ත "වාර්තානාශක" නොහොත් "බ්ලොක්බස්ටර්, හෙවත් ලූකැස්-ස්පිල්බර්ග් නිෂ්පාදනයන් වූ *ස්ටාර් වෝර්ස්* චිත්‍රපට, *ඉන්ඩියානා ජෝන්ස්* මාලාව, *ඊ. ටී.* යනාදිය ප්‍රාදූර්භූත වීම අත් දිටීය. රූපවාහිනියෙහි *ඩලාස්* සහ *ඩිනාස්ටි* යනාදිය විය. ජැක්සන්ගේ තැටිගත කිරීම් යලිදු විශාල වසයෙන් ම ඔහුගේ වරදකින් තොරව ම, ප්‍රබෝධජනක හා ගම්‍යතාශීලී එහෙත් අවසානයේ දී සාපේක්ෂ වසයෙන් අහිංසක මහජන ප්‍රතිරූපයක් වන කෘතියක් වසයෙන් මෙම පොදු චිත්‍රයට ගැලපුනි.

මෙම දෘෂ්ටි කෝනයෙන් ගත් කල, කෙනෙකුට කිව හැක්කේ ජැක්සන් නිර්මානය කිරීමට දායකව ඔහුගේ ආමන්ත්‍රනය හසුරුවා සහ ඔහුගේ පුද්ගලික විකාර සහගත හැසිරීම් පෝෂනය කොට තිබෙන සංස්ථාපිතය විසින් දැන් ඔහුව තවත් කර්තව්‍යයකට භාවිතා කරනු ඇති බවයි. එනම් බලයේ සිටින්නන්ට එරෙහිව විය හැකි අඩුම තර්ජනයේ මාවත් ඔස්සේ මහජන අතෘප්තිය අවමංගත කරවීමට තැත් දරන දූෂිත හා කෑදර මාධ්‍යයන්හි මෙම වසරේ ගොදුර හැටියට ය.

මයිකල් ජැක්සන්ගේ නඩුව කවර අතකට හැරුනද, ප්‍රසාංගිකයාට එරෙහිව කනගාටුදායක, සමහර විට ඛේදජනක පවා ඉරනමක් සූදානම් කෙරී පවතින බවට කෙනෙකුට හැඟීමක් ඇති වේ. ඇමරිකානු සමාජයේද, විශේෂයෙන්ම ඔහු සම්භාවනාවට පත් පුරුෂයෙකු සහ ගොදුරක් යන දෙකම වන ඇමරිකානු විනෝදාංශ කර්මාන්තයේද හැටි ස්වභාවයට අනුව කරුනු මේ දෙසට එල්ලවනු ඇති බව පෙනේ.

© www.wsws.org